# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2166/9 - 2020 මාර්තු මස 10 වැනි අඟහරුවාදා - 2020.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමඟ කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඩලස් අලහප්පෙරුම,
අධ්‍යාපන, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය.

2020 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. 2017.02.25 දින නිකුත් කරන ලද ක්‍රීඩා විධානයේ ජාතික ක්‍රීඩා සංගම් තේරීම් කමිටු පත් කිරීමේ ක්‍රමවේදය ඉවත් කරමින් සහ 2016.10.27වන දින නිකුත් කරන ලද අංක 1990/23 දරන රෙගුලාසි වල III කොටසේ අංක 7 හි (XIV) අයිතමය ඉවත්කොට සංශෝධනය කරන ලද 2017.02.13 දිනැති අංක 2006/13 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* අංක (7) (XIV) (අ), (ආ) සහ (ඇ) වගන්ති ඉවත් කර පහත වගන්ති ආදේශ කිරීමෙන්

අංක 7 (XIV)

(අ) සංගමයේ නිලවරණයෙන් විධායක කමිටුව පත්වූ වහාම විධායක සභාව මගින්, තාක්ෂණික කමිටුවේ, මුදල් කමිටුවේ, විනය කමිටුවේ සාමාජිකයින් ව්‍යවස්ථාවේ සඳහන් නිල කාලයට තෝරා ගැනීම සඳහා සියලුම සාමාජික අනුබද්ධ ආයතන දැනුවත් කර නාම යෝජනා ලබා ගෙන සුදුසුකම් අනුව පත් කර ගැනීම.

(ආ) අදාළ ජාතික සංගමයේ තේරීම් කමිටුව සඳහා සාමාජිකයින් 05 දෙනෙකු පත් කිරීම කළ යුතු අතර මේ සඳහා සියළුම අනුබද්ධ සාමාජික ආයතන දැනුවත් කොට නාම යෝජනා ලබා ගෙන විධායක කමිටු රැස්වීමකින් වඩා සුදුසු සාමාජිකයින් 05 දෙනෙකු තෝරා ගැනීම කළ යුතු අතර තෝරා ගන්නා ලද තේරීම් කමිටුවේ ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාටද පිටපතක් සහිතව ජාතික තේරීම් කමිටුව වෙත යොමු කර අනුමත කර ගත යුතු ය. යම් හෙයකින් ජාතික තේරීම් කමිටුව විසින් එම තේරීම් කමිටුව අනුමත නොකරන්නේ නම් නැවත නාමයෝජනා කැඳවා ජාතික තේරීම් කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. තේරීම් කමිටුව පත් කිරීමේ නිල කාලය අදාළ ජාතික ක්‍රීඩා සංගමයේ ව්‍යවස්ථාවේ සඳහන් නිල කාලයට සමාන වන අතර සාමාජිකයෙකු/සාමාජිකයින් ඉවත් වන්නේ නම් නැවත පත් කිරීමටද ඉහත කමිටුව පත් වූ පරිදිම විය යුතු ය.

1A - G 32188 — 20 (2020/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 2016.10.27 වන දින නිකුත් කරන ලද අංක 1990/23 දරන රෙගුලාසි වල III කොටසේ අංක 7 හි (XV) අයිතමය ඉවත්කොට පහත වගන්ති ආදේශ කිරීමෙන්

(xv) පෙර වර්ෂය සම්බන්ධ විගණිත මූල්‍ය ප්‍රකාශය සහ ඊට පෙර වර්ෂයන්හි විගණකාධිපතිවරයා විසින් විගණිත මූල්‍ය ප්‍රකාශනයන් සම්මත කිරීමට ඇත්නම් ඒවාද සමග වාර්ෂික වාර්තාව සිය වාර්ෂික මහා සභා රැස්වීමේ දී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී සභා ගත කිරීම.

3. 2016.10.27 වන දින නිකුත් කරන ලද අංක 1990/23 දරන රෙගුලාසි වල අංක 5(4) (උ) සහ (එ) යටතේ ඇති වගන්ති ඉවත් කර පහත වගන්ති ආදේශ කිරීමෙන් ;

(උ) ක්‍රීඩා පනතේ 32 (අ) වගන්තිය යටතේ ලිඛිත අවස්ථාවක හා නිවේදනයක් නිකුත් කරනු ලැබ ඇති සහ ක්‍රීඩා පනතේ 32 වන වගන්තියේ (අ), (ආ) සහ (ඇ) විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට ජාතික සංගමය, ක්‍රීඩා අමාත්‍යාංශය හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පත් කරන ලද විධිමත් කමිටුවක් මගින් සිදු කරනු ලැබූ පරීක්ෂණයකින් වරදකරුවෙකු බවට පත් වූ යම් ජාතික ක්‍රීඩා සංගමයක නිලධරයෙකු විධායක කමිටු සාමාජිකයෙකු වී සිටියේ නම් ;

(එ) අදාළ ක්‍රීඩා වල ජාතික සංචිතයේ, ජාතික කණ්ඩායමේ, ජාතික මට්ටමේ වර්තමාන ක්‍රීඩකයකුගේ/ක්‍රීඩිකාවකගේ දෙමාපියකු හෝ සහෝදර සහෝදරියක වේ නම් හෝ නාම යෝජනා ඉදිරිපත් කරන ලද දිනට පෙර වූ වසරක කාලයක් තුළ ක්‍රීඩකයෙකු වශයෙන් කටයුතු කර ඇත්නම් හෝ වර්තමාන ක්‍රීඩකයකු වේ නම් ;

4. 2016.10.27 වැනි දින නිකුත් කරන ලද 1990/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග සංශෝධනය කර 2019 ජූනි මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 2128/8 දරන ගැසට් නිවේදනයේ සංශෝධන අංක (02) 5.(4) (න) වගන්තිය ඉවත්කොට පහත වගන්තිය ආදේශ කිරීමෙන් ;

5. (4) (න)

I. නිශ්චිතව දක්වා ඇති කාලසීමාව වන මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විධායක කමිටුව විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශයක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට අසමත් වූ හෝ එසේ කිරීම පැහැර හැර ඇති ජාතික ක්‍රීඩා සංගමයක සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හෝ චෙක්පත් අත්සන් කරනු ලබන හෝ ඒ සම්බන්ධයෙන් වගකිව යුතු වෙනත් නිලධාරියෙකු ජාතික ක්‍රීඩා සංගමය හෝ ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා හෝ ක්‍රීඩා අමාත්‍යාංශය හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හෝ පත් කරනු ලබන විධිමත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන පරීක්ෂණයකින් වරදකරුවකු වන්නේ නම් ;

II. විගණකාධිපතිවරයා වෙත මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත හෝ පසුව භාර දෙන ලද ගිණුම් වාර්තා සම්බන්ධයෙන් මූල්‍ය අවභාවිතාවක් හෝ මූල්‍ය වංචාවක් සිදු වූ බවට විධිමත් කමිටුවක් මගින් පවත්වනු ලබන විමර්ශනයකින් වරදකරුවකු වන විධායක කමිටු සාමාජිකයකු වන්නේ නම් ;

විධිමත් කමිටුවක් යන්නෙන් ජාතික ක්‍රීඩා සංගමයේ මහා සභාව හෝ විශේෂ මහා සභාව හෝ විධායක කමිටුව මගින් හෝ සංගමයේ විනය කමිටුව මගින් හෝ එසේ නොමැති නම් ක්‍රීඩා විෂය භාර අමාත්‍යවයා හෝ ක්‍රීඩා අමාත්‍යාංශය හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පත් කරනු ලබන කමිටුවක් අදහස් වේ.

III. විධායක කමිටුව විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශ එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණාධිපතිවරයා වෙත ඉදිරිපත් නොකරන ලද ජාතික ක්‍රීඩා සංගම් සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හෝ චෙක්පත් අත්සන් කරනු ලබන වෙනත් නිලධාරියෙකු වේ නම් පරීක්ෂණයක් පවත්වා වරදකරු තීරණය කරනතුරු ඔවුනට නිලවරණය පවත්වනු ලබන ඉදිරි වර්ෂයේ නිලතල සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාව අහිමිවේ.

5. 2016.10.27 වන දින නිකුත් කරන ලද අංක 1990/23 දරන රෙගුලාසි වල III වන කොටසෙහි අංක 7 හි (XVII) වගන්තිය සහ එහි සංශෝධන වශයෙන් 2017 පෙබරවාරි මස 13 වන දින නිකුත් කර ඇති අංක 2006/13 අති විශෙෂ ගැසට් නිවේදනයේ අංක 7 (ඇ) සංශෝධිත වගන්තිය ඉවත් කොට සංශෝධනයක් වශයෙන් 2019 ජූනි මස 18 වන දින නිකුත් කරන ලද අංක 2128/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ අංක (01) 7. (XVII) වගන්තියේ (අ) සහ (ආ) ඉවත්කොට පහත වගන්ති ආදේශ කිරීමෙන් ;

(අ) ජාතික සංගමයේ නිලවරණය පැවැත්වීමට යටත් පිරිසෙන් දින 30 කට පෙරාතුව නිලධාරීන් වශයෙන් තෝරා පත් කරනු ලැබීමට ඉඩ ලැබිය හැකි සුදුසුකම් ලත් නිලධාරීන්ගේ නාමලේඛනය පිළිබඳ කටයුතු නිලවරණ කමිටුව විසින් නිමකර, ප්‍රතික්ෂේප කරනු ලබන නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට හේතුවද සඳහන් කර අනුබද්ධ ආයතන වෙත යොමු කළ යුතුවේ.

(ආ) වාර්ෂික මහා සභා රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති අනුබද්ධ ආයතන වල ඡන්දදායක නාමලේඛනයද, කලින් මුදල් වර්ෂයේ විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද ගිණුම් වාර්තාව එම මුදල් වර්ෂයට අදාළ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරිකවරයා සහතික කර එහි පිටපතක්ද ඇතුළත් දැනුම් දීමක් වාර්ෂික මහා සභා රැස්වීමට අවම වශයෙන් දින 14 කට පෙර එහි අනුබද්ධ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

(ඇ) මහා සභා රැස්වීම පැවැත්වීමට පෙර වර්ෂයේ ගිණුම් ප්‍රකාශයන් විගණකාධිපතිවරයා වෙත විගණනය සඳහා මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත ඉදිරිපත් කර ඇති සහ විගණිත මූල්‍ය ප්‍රකාශයන් නිලවරණය දිනයට දින 14 කට පෙර සිය සාමාජිකයින් වෙත යොමු කිරීමට විගණනය අවසන් කර ලැබී නොමැතිනම්, නිලවරණය සහ මහා සභා රැස්වීම විගණිත මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් නොකර සිදු කළ හැකි අතර විගණකාධිපතිවරයා විසින් විගණිත මූල්‍ය ප්‍රකාශයන් සම්මේලනය වෙත ලබාදුන් වහාම එම මූල්‍ය විගණන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශයන්ට වගකිවයුතු, මූල්‍ය වර්ෂයේ අදාළ සභාපති, ලේකම්, භාණ්ඩාගාරිකවරයා සහතික කර විශේෂ මහා සභා රැස්වීමට දින 14 කට පෙර වර්තමාන විධායක කමිටුව මගින් අදාළ අනුබද්ධ ආයතන වෙත යොමු කොට අදාළ මුදල් වර්ෂයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරිකවරයා ද වර්තමාන විධායක කමිටුවද සහභාගී වන විශේෂ මහා සභා රැස්වීමකින් සම්මත කර ගැනීම සිදු කළ යුතු යි.

06. 2016 ඔක්තෝබර් මස 27 වන දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හී අංක 05(4)(ඩ) ඡේදය ඉවත් කොට 2017 පෙබරවාරි මස 13 වන දින නිකුත් කරන ලද අංක 2006/13 අති විශෙෂ ගැසට් පත්‍රයේ (4) (ඈ) ඉවත් කර පහත වගන්තිය ආදේශ කිරීමෙන් ;

භාණ්ඩාගාරිකවරයා හෝ සහකාර භාණ්ඩාකාරිකවරයා හැර එම සංගමය විසින් ලියාපදිංචි කරන ලද, ප්‍රවර්ධනය කරන ලද, මෙහෙයවන ලද හෝ අනුමත කරන ලද යම් ප්‍රධාන ක්‍රීඩා තරඟාවලියකදී, ක්‍රීඩා උත්සවයකදී හෝ තරඟයකදී එම අදාළ ක්‍රීඩාව සම්බන්ධයෙන්, කණ්ඩායම් ක්‍රීඩාවක් සඳහා වාර දෙකකට වැඩි වාර ගණනක් හෝ යම් තනි ඉසව්වක් සඳහා හෝ ක්‍රීඩාවක් සඳහා එක් වාරයකට වඩා වැඩි වාර ගණනක් වෙනුවෙන් ක්‍රීඩකයකු ලෙස සහභාගි වී නොමැතිනම් හෝ ක්‍රීඩකයෙකු ලෙස ශ්‍රී ලංකාව නියෝජනය කර නොමැතිනම් සහ ඒ සඳහා අදාලවන ආකාරයට නිකුත් කරන ලද සහතිකයක් සතුව නොමැති නම්;

07. 2016 ඔක්තෝම්බර් මස 27 වන දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි අංක 05(4) (ත) වගන්තිය ඉවත් කොට පහත වගන්තිය ආදේශකිරීමෙන්;

(ත) පාර්මේන්තු මන්ත්‍රීවරයෙකු හෝ යම් පලාත් සභාවක හෝ යම් පලාත් පාලන ආයතනයක සභිකයකුවී සිටියි නම් හෝ එසේ පත්වේනම්;

එසේ වුවද, එම තැනැත්තා අදල සංගමය විසින් ප්‍රවර්ධනය කරනු ලබන ක්‍රීඩාවෙන් ක්‍රීඩකයකු වශයෙන් ශ්‍රී ලංකාව හෝ අනුබද්ධ ක්‍රීඩා සමාජ හෝ සංවිධාන නියෝජනය කර ඇත්නම් හෝ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ජාතික ක්‍රීඩා සංගමයක් විසින් ලියා පදිංචි කරන ලද, පවත්වන ලද හෝ අනුමත කරන ලද යම් ප්‍රධාන ක්‍රීඩා තරගාවලියකට හෝ තරගයකට ක්‍රීඩකයකු වශයෙන් සහභාගිවී ඇත්නම් සහ ඒ සඳහා අදාලවන ආකාරයට නිකුත් කරන ලද සහතිකයක් සතුව සිටින්නකු නම් ඔහු නුසුදුස්සකු නොවිය යුතුය;

08. 2018.09.22 දිනැති අංක 2089/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 08(2) නියෝගය ඉවත් කොට සංශෝධනය කරන ලද 2019 අගොස්තු මස 23 වන දින නිකුත් කරන ලද අංක 2137/86 දරන රෙගුලාසි වල 08(2) සංශෝධිත නියෝගය ඉවත් කොට පහත දක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්;

8.(2) (අ) ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් ලියාපදිංචි කරනු ලැබූ ජාතික ක්‍රීඩා සංගමයක නිලවරණ කමිටුව විසින් දෙනු ලැබූ තීරණයක් සම්බන්ධයෙන් වූ අභියාචනාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම එම නිලවරණ කමිටු තීරණය ලබා දුන් දින සිට දින 07ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් එම අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව අභියාචනා උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එවැනි අභියාචනාවන් සම්බන්ධයෙන් අභියාචනා උපදේශක කමිටුව තම නිර්දේශය; සමාලෝචනය පිණිස ලද එකී අභියාචනය යොමුකළ දින සිට සතියක් (දින 07) ඇතලත ලිඛිතව ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාට දැන්විය යුතුය.

(ආ) ජාතික සංගමයක මූල්‍ය පරිපාලනය සම්බන්ධ, හෝ විධායක කිමිටුවේ පත්වීම් සම්බන්ධ අභියාචනා ඕනෑම කාලයක් තුල අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

(ඇ) අනෙකුත් සියළුම අභියාචනා (නිලවරණ සම්බන්ධ අභියාචනා සහ ඉහත (ආ) වගන්තියේ අභියාචනා හැර) එම ජාතික සංගමය මගින් දෙනු ලැබූ තීරණය හෝ ගනු ලැබූ ක්‍රියාමාර්ගය හෝ සිදු වූ දින සිට දින 14 ක් ඇතුලත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඈ) ක්‍රීඩක, ක්‍රීඩිකාවන් තෝරා ගැනීම සම්බන්ධ අභියාචනා හැර අනෙකුත් සියලු අභියාචනා සඳහා තැන්පතු වශයෙන් රු. 5000.00ක මුදලක් ක්‍රීඩා අමාත්‍යාංශයේ සරප් අංශය වෙත ගෙවීම සිදු කොට ලදු පතෙහි පිටපතක් අදාල අභියාචනා සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය. අභියාචනාව අනුව ඔහු නිවැරදිකරුවෙකු හෝ ඉදිරිපත් කරන ලද විරෝධතාවය සනාථ වුවහොත් පමණක් එම මුදල ආපසු ගෙවනු ලැබේ.

(ඉ) ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් වන සියලු අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අභියාචනා උපදේශක මණ්ඩලය, ශ්‍රේෂ්ඨාධිකරණයේ / අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චකාරවරයන් හෝ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිළධාරීන්ගෙන් හෝ සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් විය යුතුය.

09. 2018.09.22 වන දින නිකුත් කරන ලද අංක 2089/56 දරන රෙගුලාසි වල අංක 3. (උ) වගන්තිය ඉවත්කොට පහත වගන්ති ආදේශ කිරීමෙන්;

(උ) 7 (xiv) (ඇ) නියෝගය ප්‍රකාරව යථෝක්ත කමිටුව පත් කළ දින සිට දින 30ක් ඇතුලත නිළවරණ කමිටුව විසින් ඡන්ද දායක (ඡන්දය හිමි අනුබද්ධ ආයතන) නාම ලේඛනය පිළිබඳ කටයුතු නිමකොට ජාතික ක්‍රීඩා සංගමයේ සියලු සාමාජිකයන්ට දැන්විය යුතුය. නිළවරණ පැවැත්වීමට යටත් පිරිසෙයින් දින 30කට පෙරාතුව නිලධාරීන් වශයෙන් තෝරා පත් කරගනු ලැබීමට සුදුසු නිළධාරීන්ගේ නාම ලේඛනය පිළිබඳ කටයුතු නිළවරණ කමිටුව විසින් නිම කර ඡන්දය හිමි අනුබද්ධ ආයතන වෙත යොමු කළ යුතුය.

10. 2016 ඔක්තෝම්බර් මස 27 වන දින අංක 1990/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 2016 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන් හි **iii** වන උපලේඛනයේ ජාතික ක්‍රීඩා සංගම් ව්‍යවස්ථාවට අදාල විධි විධාන යටතේ (ඔ) වගන්තිය සහ (ච) වගන්තිය ඉවත්කොට පහත වගන්ති ආදේශ කිරීමෙන්;

(ඔ) එක් එක් පුද්ගලයාට ප්‍රකාශ කිරීමට අයිතිය ඇති ඡන්ද සංඛ්‍යාව විශේෂිතව දක්වමින් එවැනි වාර්ෂික මහ සභා රැස්වීමකදී පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ඇති සාමාජික ලැයිස්තුවක් සිය සාමාජික අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධාන වලට වාර්ෂික මහ සභා රැස්වීමට අඩු වශයෙන් දින 55 කට කලින් ලබාදීම;

(ච) වාර්ෂික මහා සභා රැස්වීමේදී සිය ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා අනුබද්ධ ආයතන ක්‍රීඩා සමාජ හෝ වෙනත් සංවිධාන විසින් නම් කරනු ලබන තැනැත්තන්ගේ නම් මහ සභා රැස්වීමට / නිලවරණයට අඩු වශයෙන් දින 40කට වත් කලින් ජාතික ක්‍රීඩා සංගමයට දැනුම් දිය යුතු බවට විධි විධාන සැලසීම;

11. 2016 ඔක්තෝම්බර් මස 27 වන දින අංක 1990/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 2016 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන් හි **iii** කොටසේ **(xxi)** වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතුය.

(xxi) අදාල ජාතික ක්‍රීඩා සංගමයට නීත්‍යානුකූලව සකස් කර ගත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් නොමැති අවස්ථාවල දී ප්‍රසම්පාදනය සහ ටෙන්ඩර් ප්‍රදානය සම්බන්ධයෙන් රජයේ සම්මත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.

03 - 926

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.